ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6 Rajamalwatta Road, Battaramulla.

අංකය / எண் / No: 4/සී/අවලංගු/පොදු

ඔබේ අංකය / உமது இல / YOUR NO:

දිනය / திகதி / DATE: 2017.04.18

ප්‍රාදේශීය ලේකම්වරුන්,
නිලධාරී/ජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර්සබඳතා)

පරිපාලන ආඥා පනතේ 104 වගන්තිය යටතේ දීමනාලත් අවලංගු කිරීම සම්බන්ධවයි

පරිපාලන ආඥා පනත යටතේ ප්‍රදාන පත්‍රයක් නිකුත් කරන ලද ඉඩමක් සඳහා, හිමිකම් කීමට උරුමකරුවන් කොමැති බවට විධිමත්ව පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීම සඳහා මා වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

ප්‍රදාන පත්‍ර අවලංගු කිරීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ඇමුණුම 09 සිංහල ආකෘතිය භාෂාන්තරයෙන්ම මුද්‍රණාලය වෙත යැවීම මෙතෙක් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකළ අතර එහිදී පහත සඳහන් ගැටළු ඇතිවීමට සිදු වී ඇත.

ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර එවන ලද ඇමුණුම 09 ආකෘතියෙහි සිංහල පිටපත හා සැසඳීමේදී විවිධාකාරයේ පිටපත්වල දින එකිනෙකට වෙනස් වීම.
ප්‍රාදේශීය ලේකම්ගේ නම සටහන් කර නොතිබීම සහ ප්‍රාදේශීය ලේකම්වරු වෙනස් වීමේදී නම සංශෝධනය නොවීම.
ඇමුණුම 09 ආකෘතියෙහි අදාළ නොවන කිස්තැන් හි අදාළ නොවන බව හෝ කෙටි ඉරක් මඟින් ඒ බව දැක්වීම් කර නොතිබීම.

ඉහත සඳහන් කොටසෙන් මුද්‍රණාලය වෙත යැවෙන ඇමුණුම 09 නිවේදන ගැසට් පත්‍රයේ පළ නොකර ආපසු ලබාදීමේ මින් ඉදිරියට ඇමුණුම 09 නිවේදන භාෂාන්තරයෙන් සකස් කළ යුතු වන අතර පහත කරුණු සලකමින් අප වෙත එවීමට කටයුතු කරන්න.

භාෂාන්තරයෙන් සකසන ලද ඇමුණුම 09, පරිගණකගත කරන ලද මුද්‍රිත පිටපත් 03ක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර එවිය යුතුයි.
ඇමුණුම 09 ආකෘතිය සම්පූර්ණ කිරීමේදී අදාළ සියලු දත්ත ඇතුළත් කළ යුතු අතර අදාළ නොවන කිස්තැන් අදාළ නොවන බව අකුරින් හෝ කෙටි ඉරක් මඟින් සළකුණු කරන්න.

ඉහත සඳහන් සකසා මෙම දෙපාර්තමේන්තුව වෙත එවන භාෂාන්තරයෙන් සකස් කරන ලද ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුද්‍රණාලය වෙත යොමු කිරීමේදී එම ලිපියෙහි පිටපතක් ඔබ වෙත යොමු කරන අතර එහි අදාළ ගැසට් පත්‍රයේ පළ කිරීමට යෝජිත දිනය සඳහන් කරනු ලැබේ. මෙම නිවේදන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මඟින් පළ කරන ගැසට් පත්‍රයේ III කොටසෙහි (රජයේ මුද්‍රණාල නිල වෙබ් අඩවිය පරීක්ෂා කිරීමෙන්) අනතුරුව 2007/3 චක්‍රලේඛය අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

විශ්වාසයි,
ඉඩම් කොමසාරිස් ජනරාල්

ඉඩම් කොමසාරිස්, දකුණු පළාත - කරුණාරත්න

දුරකථන / தொலைபேசி / Tel: 011-2884051
ෆැක්ස් / பெக்ஸ் / Fax
වෙබ් ලිපිනය / இணையத்தளம் / Web Address: www.landcommissioner.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: landcom@landcommission.gov.lk